කුලියාපිටිය නගර සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කුලියාපිටිය නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණවත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පෙදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය(මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ.

1.6.1 පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූල නොවීම.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් නඩු 05 ක් පවත්වාගෙන යන අතර මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. එම නඩු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නඩු ගාස්තු ලෙස සභා අරමුදලින් රු.136,000 ක් ගෙවා තිබුණි.	ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරන බව.	ආයතනයේ පැවැත්මට අදාලවන සියලුම සිද්ධීන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ට්‍රැක්ටර් ටේලරයේ සහ ස්කැවේටර් යන්ත්‍රයේ ප්‍රත්‍යාගණන වටිනාකම පිළිවෙලින් රු.800,000 ක් සහ රු.2,500,000 ක් වුවත් ඒවා රු.400,000 ක් සහ රු.3,850,000 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මොටර් රථ ගිණුමේ වටිනාකම රු.950,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර තිබුණු රු.662,000 ක වාහන මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සියලුම වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් පෙන්විය යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති රු.3,733,695 ක වත්කම් දේපළ , පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදල වෙත ගෙවිය යුතු හිග ණය වාරික හා පොළිය රු.141,257,101 ක් වුවද එය රු.138,068,808 ක් ලෙස රු.3,188,293 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	රු.3,188,293 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇති බව.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	දේශීය ණය සංවර්ධන අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොළිය රු.42,855,935 ක් වුවද , එය රු.41,411,444 ක් ලෙස රු.1,444,491 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදි වටිනාකමට ගිණුම්ගත කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ ආදායම රු.99,000 ක් වුවද රු.297,031 ක් ලෙස රු.198,031 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ආදායම නිවැරදිව වටිනාකම ගිණුම්ගත කළ යුතුය.

(උ)	සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හා කරත්ත ප්‍රත්‍යාගණන අලාභය රු.245,290 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.704,100 ක ලාභයක් ලෙස මෝටර් රථ , කරත්ත ගිණුම හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායක වීමේ ගිණුමට ඇතුලත් කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ප්‍රත්‍යාගණන වටිනාකම ගිණුම්ගත කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට , ලැබිය යුතු ත්‍රී රෝද රථ නැවතුම්පල ආදායම රු.137,100 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර කුලී වාහන ගාල් කිරීමේ ගාස්තු ආදායම රු.151,950 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂයට අදාල විනෝද බදු ආදායම රු.742,529 ක් වුවද එය රු.549,120 ක් ලෙස රු.193,409 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර ලැබිය යුතු විනෝද බදු ආදායම රු.182,909 ක් ජංගම වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඒ)	සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් වෙන් වෙන්ව හදුනාගත හැකි වන පරිදි විස්තරාත්මක ශේෂ පිරික්සුමක් ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ශේෂ පිරික්ෂුම පිළියෙල කළ යුතුය.
(ඔ)	සමාලෝචිත වර්ෂයේ ආදාහනාගාරයේ ආදායම රු.3,963,045 ක් වුවත් එය රු.2,089,600 ක් ලෙස රු.1,873,445 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	**අනුකූල නොවීම**	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	570 හා 571	වර්ෂ 02 ක කාලය ඉක්ම වූ රු.4.911,712 ක් වූ තැන්පතු 314 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	නිදහස් කළහැකි තැන්පතු ඉදිරියේදී නිදහස් කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ආ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මාර්ගෝපදේශය			

(i)	02 වන ජේදය	රජයේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ යුතු වුවද , සභාවේ වාහන හැර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.	සියලුම වාහන ප්‍රත්‍යාගණනය කර ඇති අතර අනෙකුත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා යොමුකර ඇති බව.	ස්ථාවර වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීම සඳහා චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.
(ii)	03 වන හා 04 වන ජේද	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී රු 5000 හෝ ඊට වැඩි වටිනාකම් සහිත මූල්‍ය නොවන වත්කම් හඳුනා ගත යුතු වුවද , සභාව විසින් 5000 ට අඩු ලී බඩු හා සවි කිරීම් අයිතම 68 ක් හා යන්ත්‍රෝපකරණ අයිතම 07 ක් ජංගම නොවන වත්කම් ලෙස සටහන්කර තිබුණි..	රු.5000 ට අඩු ස්ථාවර වත්කම් ලේඛනවලින් ඉවත් කර ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරන බව.	ආයතනයේ නිවැරදි මූල්‍ය තත්ත්වය නිරූපණය වන ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම (ඌණතාවය) රු.14,212,876 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම (ඌණතාවය) රු.39,671,397 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024 වර්ෂය				**2023 වර්ෂය**			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසම්බර් 31 දිනට මුළු හිගය	ඇස්තමේ න්තුආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසම්බර් 31 දිනට මුළු හිගය
		රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
(i)	වරිපනම් හා බදු	28,625	28.947	30,067	24,932	28,675	28,288	25,737	28,860
(ii)	කුලී	30,530	29,532	24,736	4,555	216,636	25,075	24,524	3,609
(iii)	බලපත්‍ර ගාස්තු	20,920	24,261	21,559	-	17,930	21,087	3,907	-
(iv)	වෙනත් ආදායම්	170,207	189,169	151,729	17,977	210,903	138,079	154,288	13,270
	එකතුව	250,282	271,909	228,091	47,464	474,144	212,529	208,456	45,739

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වූ රු. මිලියන 45.74 ක හිග ආදායමෙන් හා රු. මිලියන 242.99 ක් වූ වර්ෂයේ බිල්කල ආදායමෙන් රු. මිලියන 228 ක් අයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 47.46 ක් තවදුරටත් හිගව පැවතුණි.	2025 වර්ෂය තුල පැවති හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමට පසුගිය වර්ෂයේ අවසාන හිඟ ආදායම එකතු කර රැස්කළ ආදායම අඩුකල පසු දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම ලැබිය යුතු වුවද ඉදිරිපත් කළ දත්ත අනුව මෙම සංඛ්‍යා අතර පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය විය.	ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින පරස්පරතාවය නිවැරදි කර ඉදිරිපත් කරන බව.	නිවැරදි දත්ත ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	**වරිපනම් හා බදු**		
(i)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් හිගය රු.24,932,458 ක් වූ අතර ඒ තුල වසර 01 ත් 05 ත් අතර රු.20,445,409 ක ශේෂයක්ද , වසර 05 ට වැඩි කාලයක සිට හිගව පවතින රු.4,487,049 ක ශේෂයක්ද පැවතුණි.	හිග වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	හිඟ ආදායම් අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	නගර සභාව විසින් අවසන් වරට බදු තක්සේරුව සිදුකර 2018 වර්ෂයේ දී සිදු කර තිබුණු අතර , කාලීනව බදු තක්සේරුව සිදු නොකිරීම හේතුවෙන් දේපලවල වර්තමාන තත්ත්වය වෙනස් වීම මත ගණනය කළ නොහැකි වරිපනම් බදු ආදායමක් සභාවට අහිමි වී තිබුණි.	2024 වර්ෂයේදී තක්සේරුව සිදු කල යුතු බවට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති බව.	පනතේ ප්‍රතිපාදන අනුව වසර 5කට වරක් වරිපනම් තක්සේරුව සිදුකර අයකිරීම් කළ යුතුය.
(ඈ)	**කුලී**		
	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තානායම් කුලී හිග ශේෂය රු.2,662,969 වූ අතර සමාලෝචිත වර්ෂයේදී කිසිදු ආදායමක් මුදලින් ලැබී නොතිබුණි.	තානායම හිඟ කුලී මුදල් අය කිරීම සඳහා දිගින් දිගටම ලිඛිතව අදාල ආයතනය දැනුවත් කර ඇති අතර, එම ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පත් කිරීමෙන් පසුව හිඟ මුදල් ගෙවීමට අවශ්‍ය පියවර ගනු ලබන බවට නගර සභාව දැනුවත් කර ඇති බව.	හිඟ කුලී කඩිනමින් අයකර ගත යුතුය.
(ඉ)	**වෙනත් ආදායම්**		
	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.80,700 ක් හා මුද්දර ගාස්තු රු.5,010,670 ක් විය.	2025 වර්ෂයේදී ලැබීමට නියමිත බව.	අදාල මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා ඉටු කිරීම සදහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබුණු නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 04 ක් සම්බන්ධයෙන් පමණක් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි.	අතුරු ව්‍යවස්ථා 37 ක් වැළඳගෙන ඇති අතර සභාව විසින් අතුරු ව්‍යවස්ථා 04 ක් පනවාගෙන ඇත. මීට අමතරව ජංගම වෙළදාම අතුරු ව්‍යවස්ථාව, සුසාන භූමි හා ආදාහනාගාර අතුරු ව්‍යවස්ථාව, සතිපොල අතුරු ව්‍යවස්ථාව කෙටුම්පත් කර ඇති බව.	අතුරු ව්‍යවස්ථා පනවාගෙන සභාවේ කටයුතු විධිමත් කිරීමට ක්‍රියා කල යුතුය.
(ආ)	වර්ෂය තුළ දිරන කසල ටොන් 1,655 ක් රැස්කර තිබුණු අතර කොම්පෝස්ට් පොහොර කිලෝග්රැම් 58,885 නිපදවා කිලෝග්රැම් 35,430 ක් අලෙවියෙන් රු.608,100 ක ආදායමක් සහ නොදිරන කසල කිලෝග්රැම් 22,989 ක් අලෙවියෙන් රු.508,514 ක ආදායමක් උපයා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් පුනරාවර්තන වැය ලෙස රු.20,774,085 ක වියදමක් දරා තිබුණි.	ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමෙන් අහිතකර පාරිසරික බලපෑම් මෙන්ම, සමාජ ප්‍රතිවිපාකවලට විසඳුම් ලබාදිය හැකිය. ඒ අනුව හුදෙක් ලාභය පරමාර්ථය නොවන මෙම ව්‍යාපෘතිය පරිසර හිතකාමී ව්‍යාපෘතියක් බැවින් ආදායම ඉක්මවා වියදම් දරා ඇති බව.	කසළ කළමනාකරණය විධිමත් කර ජනතාවට සුවදායී පරිසරයක් නිර්මාණය කරමින් සභාවේ ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකායර්ක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 04 ක වටිනාකම රු.32,400,542 ක් වූ අතර , එම ශේෂය තුල වර්ෂ 1 ත් 5 ත් අතර කාලයට අදාල රු.27,913,493 ක් හා වසර 05 කට වඩා වැඩි රු.4,487,049 ක් විය.	නිදහස් කිරීමට හා ආදායමට ගැනීමට හැකියාව ඇති තැන්පත් ඉදිරියේදී නිදහස් කිරීමට හා ආදායමට ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් 11 ක එකතු වටිනාකම රු.852,040,467 ක් වූ අතර , ඒ තුල වසර 1 ත් 5 ත් අතර කාලයට අදාලව රු.844,838,794 ක් හා වසර 5 කට වඩා පැරණි රු.7,201,673 ක ශේෂයක් විය.	වියදම් ණය හිමි සහ කර්මාන්ත ණය හිමි වසර දෙකකට වඩා ඉක්මවා නොමැති බැවින් අදාල ගෙවීම් මෙම වසර තුලදී සිදු කරන බව.	ගෙවිය යුතු ශේෂයන්වල පැවැත්ම සොයා බලා බැදීම්වලින් නිදහස් වීමට ක්‍රියා කල යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වටිනාකම රු.62,424,874 ක් වූ වාහන 02 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් වී නොමැති පෙන්වා දී ඇති වාහන ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කරන බව.	සියලුම වත්කම් ලේඛනගත කළ යුතුය.
(ආ)	වටිනාකම රු.50,000 ක් වූ ට්‍රැක්ටරය සහ රු.212,000 ක් වටිනාකම වූ ඩබල් කැබ් රථය භෞතිකව නොපැවතුණි.	ලේඛන පරීක්ෂාවෙන් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සභාව සතු වත්කම්වල, පැවැත්ම හා ආරක්ෂාව පරීක්ෂා කර බලා ඌණතා සම්බන්ධයෙන් විගණනයට වාර්තා කළ යුතුය.
(ඇ)	සභාව සතු ගොඩනැගිලි හා වත්කම්වල දීර්ඝකාලීන පැවැත්ම ආරක්ෂා කර ගැනීමට වැඩ පිළිවෙලක් සකස් කර කාලීනව ක්‍රියාත්මක කිරීම සභාවේ වගකීමක් වුවත්, ඒ කෙරෙහි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳපොල පිහිටි ගොඩනැගිල්ලේ ව්‍යුහයට සිදු වී ඇති හානිය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මේ සම්බන්ධව සම්පූර්ණ නඩත්තුව පිලිබඳව මේ වන විට අවදානම තක්සේරු කර අදාල ආයතනවලින් වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු කරමින් පවතින බව.	සභාව සතු ගොඩනැගිලිවල ආරක්ෂාව සඳහා වැඩ පිළිවෙලක් සකස් කල යුතුය.
(ඈ)	කුලියාපිටිය නගර ශාලාව කාලීනව අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් නගර ශාලාවේ අභ්‍යන්තර හා බාහිර කුළුණුවල පහළ මට්ටම සිරස් අතට පුපුරා ඉදිමී පැවතීම , ශාලාවේ බිත්ති පුපුරා පළුදුව පැවතීම , වහලයේ සිවිලිම් කොටස් ගැලවී ගොස් පැවතීම හා බැල්කනියේ පවතින පුටු ආදිය දූවිලි සහිතව නිසි නඩත්තුවකින් තොරව පැවතීම යන අඩුපාඩු පැවතුණි. ඒ නිසා නගර සභාවේ ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ගයක් මෙන්ම, නගර සභා සීමාවේ පදිංචි කරුවන්ගේ පොදු උපයෝගිතා ඉටුකර ගැනීමට අදාල වැදගත් සේවාවක් සැපයීම යන කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	කුලියාපිටිය නගර ශාලාවේ අභ්‍යන්තර හා බාහිර පිපුරුම් හා පලුදු වීම් අලුත්වැඩියා කර ඇත. ඉතිරි වැඩ වෙනුවෙන් රු.11,007,184 ක මුදලක් ඇස්තමේන්තුගතව ඇති අතර ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත්කර ඇති බව.	නගර ශාලාව අලුත්වැඩියා කර උපරිම ආදායම් උපයන මාර්ගයක් බවට පත්කර ගැනීමට ක්‍රියා කල යුතුය.

(ඉ)	ගිනි නිවන රථය , ජල බවුසර් රථ 02 ක , ටේලරය හා තණකොළ කපන උපාංගය සහිත ඇග්‍රිමෙක් අත්ට්‍රැක්ටරය යන වත්කම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ජල බව්සර් 02, ටේලරය හා ඇග්‍රිමෙක් ජෙට් 5 අත්ට්‍රැක්ටරය සහිත තණකොළ කපන උපාංගය සඳහා අංක සහිත පොත් නොමැති හෙයින්, පළාත් පාලන කොමසාරිස් (වයඹ) මගින් විමසා ඉදිරියේදී ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලැබේ.	වත්කම් විධිමත් ලෙස පවරා ගැනීමට ක්‍රියා කල යුතුය.
(උ)	වටිනාකම රු.13,649,286 ක් වූ ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර, යාවත්කාලීන කර නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛන නිවැරදි කර යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	ස්ථාවර වත්කම් ලේඛන නිවැරදි කර ඒ අනුව ගිණුම් පිළියෙල කළ යුතුය.

3.4 කතර්ව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුලියාපිටිය නගර සභාව විසින් නව පොදු වෙළඳපල හා බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.996,631,284 ක මුදලකට 2020 ජූලි 20 දින කොන්ත්‍රාත්කාර ආයතනයක් සමග ගිවිසුම්ගත වී තිබුණද 2025 මැයි 01 දින වන විටත් කාර්යය අවසන් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. i. දේශීය ණය සංවර්ධන අරමුදලින් 2019 වර්ෂයේ ණය ලබාගෙන තිබුණ අතර 2020 ජූලි 20 වන විට කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම්ගත වීමට වසරක කාලයක් ප්‍රමාද වී තිබුණි. ii. පිළිගත හැකි ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කර නොතිබුණ අතර දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණය ලබා ගැනීමේ අරමුණ පෙර දැරිව පමණක් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. iii. සභාව විසින් අදාල කොන්ත්‍රාත්කාර සමාගම සමග 2020 ජූලි 20 දින ගිවිසුම්ගත වන විට කොවිඩ් අර්බුදය පැන නැගී තිබුණ අතර එමගින් ඇතිවිය හැකි බලපෑම් සම්බන්ධයෙන් හා මිල විචලනයන් හඳුනා ගැනීමට උපදේශන ආයතනය අපොහොසත් වී තිබුණි. iv. ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී අරමුදල් සම්පාදන කටයුතු සලකා බලා අදියරෙන් අදියර ගොඩනැගිල්ල සැලසුම්	උපදේශක ඉංජිනේරු සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) මගින් ලබා දුන් උපදෙස් මත කටයුතු කර ඇති අතර ඊට අදාල එකඟතා ගිවිසුම් සම්බන්ධයෙන් අවසන් තීරණ මෙතෙක් ලැබී නොමැති අතර ලබා දෙන නිර්දේශයන්ට අනුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව.	අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කර අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට ක්‍රියා කළ යුතුය.

සකස් කිරීමට අවධානය යොමු නොකර මධ්‍යගත වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කිරීම නිසා සම්පූර්ණ ගොඩනැගිල්ලම වැඩ නිම කිරීමෙන් පසු ක්‍රියාකාරීත්වයට පත්වන ආකාරයට සකස් කිරීමත් ඒ සම්බන්ධව අරමුදල් සලකා බැලීමෙන් පසුව අදාල සැලසුම සකස් කිරීමට උපදේශන සමාගම අපොහොසත් වී තිබුණි.

v. උපදේශන සමාගම 2023 ජනවාරි 22 දින වන විට සිය උපදේශන කාර්යයෙන් ඉවත් වී ඇති අතර 2019 ඔක්තෝබර් 07 දිනැති ගිවිසුමේ 2.10 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ)	සමාලෝචිත වර්ෂයේ නිම කිරීමට සැලසුම්කල රු.537,882,191 ක් වූ ව්‍යාපෘති 16 ක වැඩ අවසන් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඉටු කිරීමට සැලසුම් නොකළ කර්මාන්ත 05 ක් වෙනුවෙන් රු.3,941,259 ක් වැයකර තිබුණි.	මූල්‍ය හිගකම, ආණ්ඩුකාර අනුමැතිය නොලැබීම, අවශ්‍යතාවය ඇති නොවීම, බහුකාර්ය ගොඩනැගිල්ලේ වැඩ අවසන් නොවීම වැනි හේතු මත මෙම කාර්යයන් ඉටු නොකරන ලදී.	ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති තෝරා ගැනීම හා ව්‍යාපෘති කටයුතු අධීක්ෂණයකින් යුතුව ක්‍රියාත්මක කිරීම කල යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 58 ක් හා අතිරික්ත 01 ක් පැවති අතර පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි	ජ්‍යෙෂ්ඨ තෘතීයික සහ ද්විතියික තනතුරු සඳහා බඳවා ගැනීම් වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන බැවින් කඩිඉම් නිර්දේශ සහිතව යොමු කර ඇති බව.	පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයින් 08 දෙනෙකුට අදාලව රු.326,515 ක් අය නොවන සේවක ණය ශේෂයක් පැවතුණි.	අදාල ණය අයකර ගැනීමට කටයුතු කරන බව.	හිග සේවක ණය අයකරගත යුතුය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 03 සිට සියයට 100 දක්වා සහ වියදම් විෂයයන් 07 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 09 කට වඩා වැඩි විචලනයක් පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.	ගාස්තු සංශෝධනය නිසා ආදායම් වැඩි වී ඇති බව.	තාත්විකව ඇස්තමේන්තු සකස් කළ යුතුය.

4.2 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ළගා කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.14,330,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු සංවර්ධන වැඩසටහන් 34 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා 2024 වර්ෂය තුල ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද කුලියාපිටිය නගර සභාවට පවතින මූල්‍ය අර්බුදය හමුවේ අත්‍යවශ්‍ය වැඩසටහන් පමණක් සිදු කිරීමට කළමනාකරණ කමිටු තීරණය කරන බව.	අවශ්‍යතාවය මත ඉලක්ක පිහිටුවා ගත යුතුය.